# 12 වන දවස

## ''ඔබගේ රාජ්‍යය පැමිණේවා''

නියමිත **මොහොත පරිපූර්ණ වී තිබේ** නොහොත් සර්ව සම්පූර්ණ වී තිබේ. සමිඳාණන් වහන්සේ තම ජීවිත අත්දැකීමෙන් එය අත්දුටු සේක (ශු. මාක් 1:15).

දේව රාජ්‍යය උදාවී තිබේ. එය මනසින්, සිතින් පමණක් නොව මුලු ආත්මයෙන් ම සමිඳාණන් වහන්සේ දකින සේක. ඔවුන් වහන්සේ සැම සිදුවීමක් තුළ ම සොයනුයේ දේව තාත්තාගේ කැමැත්ත  ය. දේව රාජ්‍යය ය. අප හැම දෙනාට දේව රාජ්‍යය සොයන්නට, දකින්නට පිපාසයක් ඇති කර ගන්නට ඇරයුමකි.

**''දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ අභිරහස් පිළිබඳ අවබෝධය ඔබට දී ඇත. එහෙත්, දැක දැකත් නොදක්නා පිණිස ද අස අසාත් නොවටහගන්න පිණිස ද සෙසු අයට ඒවා උපමා මගින් දෙනු ලැබේ''** (ශු. ලූක් 8:10).

ප්‍රසාද ස්නාපනය ලැබූ මොහොතේ සිට ම අපි ඔවුන් වහන්සේගේ පුත්‍රභාවය ලැබූවන් වෙමු. අපි ක්‍රිස්තුස් වහන්සේ සමග හවුල් උරුමක්කාරයෝ වන්නෙමු. එසේ නම් අපගේ ජීවිත සිදුවීම්, එදිනෙදා සිදුවෙන දේ සමග අපටත් දේව කැමැත්ත, දේව රාජ්‍යය අප අතර බව දැකිය හැකි ද? (මෙනෙහි කරන්න)

අබ්බා පියාණන් වහන්සේ නොවෙනස් ව සදාකාලිකව ම අප අතර වැඩ සිටින සේක. ඔවුන් වහන්සේ අපව ජීවිතයේ පූර්ණත්වයට ගෙන යන්නාහ. ඔවුන් වහන්සේගේ රාජ්‍යය, එනම් දේව රාජ්‍යය දැකීමට බාධා කරන අප වසා ඇති අඳුරු වළා පටල, (පාපය, අන්ධකාරය) තුළ පවා දේව රාජ්‍යය දකිමු. හත්වන ඇසින් දේව රාජ්‍යය අප අතර දැකීමේ වරය ඉල්ලා අයදිමු.

**දවස පුරා :-** ✵ ''ගමනට එළියකි - හත්වන ඇස ඇරී...''
✵ ශු. ලූක් 8:4-15 කියවන්න
✵ ගීය - ''හුදෙකලාව හුදෙකලාව'' ගීය මෙනෙහි කරන්න